**ලාහුගල ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

----------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජනවාරි 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 මැයි 29 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ලාහුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| i. සමාලෝචිත වර්ෂයේ දී පළාත් සභාවෙන් ලැබුණු රු.49,926 ක් වටිනා පුස්තකාල පොත්වල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | මේ වන විට එම පොත් වටිනාකම ගිණුම්ගත කර ඇත. |
| ii. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.285,000 ක සභික දීමනා ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | මන්ත්‍රී දීමනා වෙනුවෙන් ලැබිය යුතු රු.285,000 ක මුදල ගිණුම්ගත කර නොතිබූ අතර ඉදිරියේ දි එම කටයුත්ත නිවැරදිව සිදු කරමි. |
| iii. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු.285,000 ක සභික දීමනා සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | සභික දීමනා වෙනුවෙන් 285,000 ක මුදලක් 101A යටතේ අයවැය ලේඛනයේ ගිණුම්ගත කර තිබුණි. |

(ආ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.90,459,889 ක වත්කම් විෂයන් 03 ක් හා රු.2,424,152 ක වගකීම් විෂයක් විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | මේ පිළිබඳව විධිමත් ආකාරයේ තොරතුරු සොයාගත නොහැක. ඉදිරියේ දී සොයා බලා කටයුතු කිරීමට උත්සාහ දරන්නෙමු. |

**1.4 අනුකූල නොවීම**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 217 | - | සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ඉඩම් පවරාගෙන තක්සේරු වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | රීති අනුව කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බලපත්‍ර ලබාදුන් විගස තක්සේරු කර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට අපේක්ෂා කරමු. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| (i) | මුදල් රෙගුලාසි 104 | 22,500 | කැබ් රථයක් 2019 අප්‍රේල් 22 දින අනතුරට පත්වීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු කරමි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | 1,253,612 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්ම වූ | මුදල් රෙගුලාසි ප්‍රකාරව | තැන්පතු වලට අදාල තොරතුරු සොයා ගැනිමට නොහැකි වී |

| | | | |
|---|---|---|---|
| | තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කටයුතු කළ යුතු වේ. | ඇත. ඉදිරියේ දී සොයා බලා කටයුතු කරමි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ------------- | | | |
| (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය - | සභාව සතු වාහන 11 ක ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ වන විට ඉන්ධන පරීක්ෂාව සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |
| (ii) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය - | නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මේ වර්ෂයේ දී ස්ථාපිත කිරීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,597,744 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.212,437 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

----------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බැංකු ජංගම ගිණුම් 02 කට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශනවල දීර්ඝ කාලයක් තිස්සේ මුදල් පොතේ ශේෂයට එකතු කිරීම ලෙස ගලපා තිබුණු රු.69,609 ක් හා අඩුකිරීම ලෙස ගලපා තිබුණු රු.52,776 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**2.3 ආදායම් පරිපාලනය**

----------------------

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්**

---------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම් | 2019 බිල්කළ ආදායම් | 2019 රැස්කළ ආදායම් | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම් | 2018 බිල්කළ ආදායම් | 2018 රැස්කළ ආදායම් | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| වරිපනම් හා බදු | - | - | - | - | - | - | - | - |
| කුලී ආදායම් | 2,102,000 | 1,142,837 | 1,142,837 | 200 | 1,602,000 | 1,297,112 | 1,297,112 | 200 |
| බලපත්‍ර ගාස්තු | 215,000 | 285,360 | 285,360 | 26,563 | 230,000 | 215,000 | 215,000 | 26,563 |
| වෙනත් ආදායම් | 1,325,000 | 4,296,001 | 3,731,616 | 564,359 | 2,000,000 | 1,169,200 | 1,169,200 | - |
| | **3,642,000** | **5,724,198** | **5,159,813** | **591,122** | **3,832,000** | **2,681,312** | **2,681,312** | **26,763** |

### 2.3.2 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව එක් දුරකථන කුළුණක් සඳහා අනුමැතිය ලබා දීමට අවම වශයෙන් රු.20,000 බැගින් අයකළ යුතු වුවද, සභා බල ප්‍රදේශයේ පවතින දුරකථන කුළුණු 08 කින් රු.160,000 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. | හිඟ ගාස්තු අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී දුරකථන කුළුණු වලින් මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

**(අ) උසාවි දඩ**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.564,359 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ අයකර ගත යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**(ආ) මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | මේ වන විටත් අතුරු ව්‍යවස්ථා සකස් කර පළාත් සභාවට යොමුකර ඇත. |

#### (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | එක් එක් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරමි. |

#### (ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් එක්සත් ජාතීන්ගේ "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ස්ථාපිත කළ යුතු වේ. | ඉදිරියේ දී කටයුතු කරමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 07 ක පුරප්පාඩු 12ක් හා එක් නිලධාරියෙකුගේ අතිරික්තයක් පැවතුනි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවාගත යුතු වේ. | මෙම කාර්ය මණ්ඩල පුරප්පාඩුව පිළිබඳ ගැටලුව වර්ෂ ගණනාවක සිට පැවත එන අතර අවස්ථා කිහිපයකදී ම ඉහළ නිලධාරින් දැනුවත් කර ඇත. |
| (ආ) සභාවේ සේවය කර වැඩ තහනම් වූ හා ස්ථාන මාරු වී ගිය සේවකයින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.8,000 ක සේවක ණය ශේෂය 2019 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | එම සේවක ණය අය කිරීමට කටයුතු කරමි. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 නඩත්තු හා අලුත්වැඩියා නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 21 කින් වාහන 09 ක් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතියද, එම වාහන අලුත්වැඩියා කර භාවිතයට නොගෙන සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | වාහන භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ අඩු ආදායම් තත්ත්වය මෙයට හේතුවයි. |

### 3.3.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතුව පවතින වාහන හා යන්ත්‍රෝපකරණ 21 කින් වාහන 13 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන වල නිත්‍යානුකූල අයිතිය සභාවේ නමට පවරා ගත යුතුවේ. | ඉදිරියේ දී පවරා ගැනීමට කටයුතු කරමි. |

**3.4 ප්‍රසම්පාදනය**

**--------------**

**ප්‍රසම්පාදන සැලැස්ම**

**-----------------------**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අනුමත අයවැය ලේඛනයට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරි වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |